**ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය- 2013**

-----------------------------------------------

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැ) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ල.ර) අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක 2217 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 6 උපලේඛනයේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග අමාත්‍යාංශය (ම.අ) දැනට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය (ව.හා.ම.අ) හා මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ), පිළිවෙලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ජාතික මහාමාර්ග ජාලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සහ මාර්ග අංශයේ ආයතන ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. තවද ව්‍යාපෘතිය මගින්,

I. මාර්ග අංශයේ ආයතන වැඩි දියුණු කිරීම,
II. ව්‍යාපෘති මාර්ග වැඩිදියුණු කිරීම; සහ
III. නඩත්තු කොන්ත්‍රාත් මත පදනම් වූ නියමු කාර්යසාධනය සංවර්ධනය කිරීම.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,181 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 208 ක් වන අතර එයින් රු.මිලියන 15,275 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 150 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. 2008 පෙබරවාරි 15 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් (අ.ගි) අත්සන් කර තිබුණු අතර ඒ අනුව ආරම්භක ණය මුදල ඇතුළත ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීමට ණය ගිවිසුම 2008 මැයි 27 දින සංශෝධනය කර තිබුණි. ඉහත ණය ගිවිසුමට අමතරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ජාත්‍යන්තර සංවර්ධන සඳහා වූ ඛනිජ තෙල් අපනයනය කිරීමේ රටවල සංවිධානය (ඔපෙක්) අරමුදල (ආ.සං.ඔ.අ) සමඟ 2010 ඔක්තෝබර් 04 දින අංක 1355 පී දරන වෙනත් ණය ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර රු.මිලියන 880 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 8 ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. රු.මිලියන 9,350 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 85 ක් වෙන් කිරීම සඳහා අංක-2767 එස්ආර්අයි දරන පරිපූරක ණය ගිවිසුමක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ 2011 ඔක්තෝබර් 04 දින අත්සන් කර තිබුණි. ඉහත පරිපූරක ණය ගිවිසුම අනුව වෙන්කිරීම් සඳහා 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වෙනම ඉදිරිපත් කර ඇත. ආරම්භක ණය ගිවිසුම අනුව, ව්‍යාපෘති කටයුතු 2006 අප්‍රේල් 07 දින ආරම්භ කර තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිත විය. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලේ මූල්‍ය කටයුතු 2015 ජූනි 30 දින අවසන් වනු ඇත. කෙසේ වෙතත්, පරිපූරක ණය ගිවිසුම යටතේ සිදුකළ යුතු කාර්යයන් 2016 ජූනි 30 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම.**

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනවලින් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම් ණයවලින් කරනු ලැබූ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදීය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව, වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව,

(ඍ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණේද යන බව,

**3. මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා තිබුණු බව, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන පරිදි 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**4.1. මූල්‍ය කාර්යසාධනය**

----------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.මිලියන 1,607 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 25,322 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, පසුගිය වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

සටහන : නොනිමි වැඩ, නිම කරන ලද සිවිල් වැඩ ගිණුමට මාරු කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශේෂයන් සෘණ අගයක් ගෙන තිබුණි.

## 5. <u>විගණන නිරීක්ෂණ</u>

### 5.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් - පිරිවැය මත | - | 582,942 | 9,343,881 |
| <u>නිම කරන ලද වැඩ</u> | | | |
| වැඩ | 21,301,740,878 | - | 21,301,740,878 |
| උපදේශන | 860,175,817 | - | 860,175,817 |
| ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කරවීමේ පිරිවැය | 1,157,219,220 | - | 1,157,219,220 |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම් | 945,757 | 62,242,975 | 364,907,493 |
| මහාමාර්ග වැඩි දියුණු කිරීම | | | |
| * ඉඩම් අත්පත් කර ගැනීම | (1,123,676,454) | (455,502,746) | 1,031,098,732 |
| * සිවිල් වැඩ | | | |
| * ඉදිකිරීම් අධීක්ෂණය | (20,727,048,132) | 4,936,067,684 | - |
| | (860,175,817) | 72,977,250 | - |
| මහාමාර්ග ලේකම් කාර්යාලය ඉදිකිරීම | 408,988,696 | 741,893,462 | 1,638,671,863 |
| කාර්ය සාධනය පදනම් කරගත් නඩත්තු කටයුතු | - | 78,863,519 | - |
| මූල්‍ය ගාස්තු | - | 162,340,389 | - |
| ශුද්ධ ජංගම වත්කම් | 588,601,674 | (1,438,491,103) | (1,041,243,559) |
| එකතුව | 1,606,771,638 | 4,160,974,372 | 25,321,914,324 |

කොන්ත්‍රාත් අංක ICB – 01 යටතේ පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගයේ පුත්තලම සිට නොච්චියාගම දක්වා වූ කොටස පුනරුත්ථාපනය කිරීමේ අවසාන බිල්පතට අනුව, හිඟහිටි ශේෂය රු.3,558,841 ක් වූ අතර ව්‍යාපෘතියේ ගෙවිය යුතු ගිණුම අනුව ශේෂය රු.10,022,023 ක් ලෙස පෙන්නුම් කර තිබුණි. ව්‍යාපෘතිය විසින් රු.6,463,182 ක් වූ වෙනස ගිණුම හා සසඳා නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූලික ණය ගිවිසුමට අනුව කි.මී.270 ක දිගින් යුත් ජාතික මාර්ග 5 ක වැඩිදියුණු කිරීම් හා පුනරුත්ථාපන කටයුතු, මහාමාර්ග ලේකම් කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ කාර්යසාධනය මත පදනම් වූ මාර්ග නඩත්තු කටයුතු පිළිබඳ නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් එ.ජ.ඩො.මිලියන 158 ක් වෙන්කර තිබුණි. 2008 මැයි 27 දින කරන ලද සංශෝධනයන්ට අනුව වැඩ විෂය පථය මූලික වෙන් කිරීම ඇතුළත වෙනස් කර තිබුණි. ව්‍යාපෘතියෙන් ලද තොරතුරුවලට අනුව එක් එක් සංරචකය යටතේ ණය සපයනු ලබන නියෝජිත ආයතනය මඟින් වෙන් කරන ලද අරමුදල් සහ 2013 දෙසැම්බර් 31 දිනට ඒවායේ උපයෝජනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ක්‍රියාකාරකම | කරන ලද වෙන්කිරීම් | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජිත/වියදම් කළ මුදල | | |
|---|---|---|---|---|---|
| | ආ.ස.බැ. | ජා.ස.ඕ.අ | විදේශ ණය | | ශ්‍රී.ලං.ර |
| | එ.ජ.ඩො. ('000) | එ.ජ.ඩො. ('000) | එ.ජ.ඩො. ('000) | රු. ('000) | රු. ('000) |
| සිවිල් වැඩ | | | | | |
| - මාර්ග වැඩි දියුණු කිරීම. | 125,359 | 8,000 | 133,359 | 15,325,817 | 4,234,873 |
| - කාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කටයුතු. | 2,514 | - | 2,514 | 288,675 | 34,995 |
| - ගොඩනැගිලි ඉදිකිරීම. | 8,535 | - | 8,535 | 1,026,148 | 402,712 |
| ඉඩම් අත්පත් කරගැනීම සහ නැවත පදිංචි කරවීම. | - | - | - | - | 2,188,318 |
| උපදේශන සේවා | | | | | |
| - ආයතනික හා ප්‍රතිපත්තිමය සහාය | 273 | | 273 | 31,058 | |
| - ඉදිකිරීම් අධීක්ෂණය | 6,441 | | 6,441 | 728,151 | 106,389 |
| ව්‍යාපෘති කළමනාකරණය | 1,875 | | 1,875 | 214,949 | 153,880 |
| පොළිය හා බැඳීම් ගාස්තු | 5,003 | | 5,003 | 585,949 | - |
| එකතුව | 150,000 | 8,000 | 158,000 | 18,200,747 | 7,121,167 |

ඉහත සඳහන් තොරතුරුවලට අනුව ණය සපයනු ලබන නියෝජිත ආයතන විසින් වෙන් කරන ලද රු.මිලියන 18,201 ට සමාන වූ එ.ජ.ඩො. මිලියන 158 ක් වූ අරමුදල් 2013 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතිය විසින් සපයන ලද තොරතුරුවලට අනුව සියලු ජාතික මාර්ග 5 වැඩිදියුණු කිරීම් සහ පුනරුත්ථාපන කටයුතු දෙසැම්බර් 31 දිනට නිම කර අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් භාරදී තිබුණි. කෙසේ වෙතත්, ඉහත සඳහන් මාර්ගවල වැඩිදියුණු කිරීම් සහ පුනරුත්ථාපන කටයුතුවල නියැලුණු කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවිය යුතු එකතුව රු.මිලියන 1,023.66 ක් 2013 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකර පැවතුණි. තවද, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා

ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන් කරන ලද එකතුව රු.මිලියන 888.15 ට සමාන එ.ජ.ඩො. මිලියන 8.54 ක් ව්‍යාපෘතිය විසින් 2013 මැයි 31 දිනට සම්පූර්ණයෙන්ම උපයෝජනය කර තිබුණි. එබැවින් වැඩ පිළිබඳ මූලික විෂය පථයේ විචලනයන් හේතුවෙන් දරන ලද අමතර වියදම් ශ්‍රී.ලං.රජයට දැරීමට සිදුවනු ඇත.

## 6.2. කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

මහාමාර්ග ලේකම් කාර්යාලය සඳහා වන මහල් 8 කින් යුත් ගොඩනැගිල්ලේ පළමු මහල් 3 හි ඉදිකිරීම් කටයුතු නිමකිරීමේ කොන්ත්‍රාත්තුව 2010 අගෝස්තු 17 දින රු.මිලියන 599.30 ක පිරිවැයකට පෞද්ගලික පාර්ශවයකට පිරිනමා තිබුණු අතර එම පළමු මහල් 3 හි ඉදිකිරීම් කටයුතු 2011 නොවැම්බර් 04 දිනට පෙර නිම කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත්, එම ඉදිකිරීම් කටයුතුවලින් සියයට 90 ක් නිමවන අවස්ථාවේදී, පළමු කොන්ත්‍රාත්තුවට කරන ලද වෙනසක් වශයෙන් රු.මිලියන 568.14 ක අමතර පිරිවැයකට ඉතිරි මහල් 5 හි ඉදිකිරීම් කටයුතු එම කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කිරීමට 2011 දෙසැම්බර් මසදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පියවර ගෙන තිබුණි. රු. මිලියන 795.72 ක ඇස්තමේන්තුගත පිරිවැයකට එම ගොඩනැගිල්ලේ මහල් සංඛ්‍යාව තව මහල් දෙකකින් වැඩි කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2012 ජුනි මාසයේදී තීරණය කර තිබුණි. එබැවින්, මහල් දහයකින් සමන්විත එම ගොඩනැගිල්ලේ අපේක්ෂිත පිරිවැය 2013 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,963.17 ක් විය. එම පළමුවන වෙනස සඳහා වැයවන අමතර පිරිවැය දේශීය දායකත්වය විසින් දැරීම සඳහා 2013 ජුලි 11 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2013 පෙබරවාරි මාසය සඳහා වූ උපදේශකවරයාගේ ප්‍රගති වාර්තාව අනුව එම ගොඩනැගිල්ලේ මහල් 10 වැඩ සැලකිය යුතු තරමින් නිම කර තිබුණි. කෙසේ වෙතත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 සහ 8.13.4 ඡේද අනුව එම ගොඩනැගිල්ලේ මහල් සංඛ්‍යාව තවත් මහල් 2 කින් වැඩි කිරීම සඳහා වූ විෂය පථය විචලනය සඳහාත්, ඒ සම්බන්ධයෙන් වැය වන පිරිවැය සහ ලබා දී තිබුණු කාලය දීර්ඝ කිරීම සඳහාත් අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා කොන්ත්‍රාත්කරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමඟ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ලිඛිත ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට අත්සන් කර නොතිබුණි.

(ආ). කොන්ත්‍රාත්කරුවන් විසින් 2012 දෙසැම්බර් සිට 2013 මැයි දක්වා රු.මිලියන 242.70 ක බිල්පත් ඉදිරිපත් කර තිබුණත්, 2013 දෙසැම්බර් 31 වන විටත් එම බිල්පත් නිරවුල් කර නොතිබුණි. කොන්ත්‍රාත්කරුට ඉදිරි වර්ෂයේදී පොලිය ගෙවීම සඳහා මෙම ප්‍රමාදය හේතුවක් වනු ඇත.

(ඇ). කොන්ත්‍රාත් ගිවිසුමේ අන්තර්ගත විශේෂිත කොන්දේසියට අනුව, පොදුකාර්ය පිරිවැය මත සියයට 15 ක ලාභාන්තිකයක් නිශ්චය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, ඉහත කොන්දේසියට පටහැනිව සියයට 25ක ලාභාන්තිකයක් ඉල්ලුම් කළ අවස්ථා නිරීක්ෂණය විය.

(ඈ). කොන්ත්‍රාත්කරුගේ අංක සී/369/10/එච්එස්බී-එච්ඕ/2013 සහ 2012 නොවැම්බර් 17 දිනැති ලිපිය අනුව, ඉදිකිරීම් කටයුතුවල 3 වන අදියර සඳහා එකඟ වී තිබු ප්‍රමාණය ඉක්මවා අමතර ප්‍රමාණ ඉල්ලා නොසිටීමට එකඟ විය. කෙසේ වෙතත්, රඳවාගත් සේවකයන්, වැඩබිම්වල ද්‍රව්‍ය සහ ප්‍රවාහන ගාස්තු යනාදිය වෙනුවෙන් එකතුව රු.මිලියන 6.14 ක අමතර මුදලක් ඉල්ලා තිබුණු අතර ඒ අනුව ගෙවීම්ද කර තිබුණි.

(ඉ). ඉදිකිරීම් කටයුතුවල විෂය පථයේ නිතර කෙරෙන වෙනස්කම් තුළින්, කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීම සඳහා විවිධ ගාස්තු යොදා ගැනීමට ඉඩ ප්‍රස්තා සලසා තිබුණි. එබැවින්, අමතර

වැඩ සඳහා අදාළ කර ගත යුතු සියයට 13 සිට සියයට 68 දක්වා පරාසයක වූ වෙනස්කම්, ඉදිකිරීම් කටයුතුවල අදියර 3 යටතේ සිදුකර තිබුණි.

(ඊ). රථගාල සඳහා ඉඩපහසුකම් ගොඩනැගිල්ල තුළ සැපයීමට සැලසුම් කර නොමැති අතර ඒ සඳහා අමතර ඉඩක් අවශ්‍ය වනු ඇත. තවද, ඒ සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවනු ඇත.

(උ). ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2012 නොවැම්බර් 30 දිනට හෝ ඊට පෙර මූලිකව නිම කිරීමට අපේක්ෂිත වූ අතර අමතර මහල් දෙක නිම කිරීම සඳහා කාලය ඉඩදීමෙන්, එය 2014 නොවැම්බර් 30 දින තෙක් දීර්ඝ කරන ලදී. 2014 පෙබරවාරි අවසානය වන විට එම කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 60 ක සාමාන්‍ය අගයක් විය. කොන්ත්‍රාත්කරු විසින් නියමිත දිනවලට කටයුතු නිම කිරීමට හැකිවනු පිණිස ප්‍රමාණවත් කම්කරුවන් සහ උපකරණ සේවයේ යොදා නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වුවද, මිල උච්චාවචන සඳහා 2013 දෙසැම්බර් 31 වන දිනට රු. මිලියන 59.54 ක ගෙවීම් කර ඇත.

**7.** <u>මානව සම්පත් කළමනාකරණය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවක තනතුරු 35 ක් අනුමත කරනු ලැබුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘති කාර්යාලයේ කාර්ය මණ්ඩලය සාමාජිකයන් 21 දෙනෙකුගෙන් සමන්විත විය. කෙසේ වුවද, ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයන් 03 දෙනෙක්, එක් ඉන්ජිනේරුවරයෙක් (පාලම් සැලසුම්) වැනි ප්‍රධාන තනතුරු ද ඇතුළත් අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු තුළ ඇබෑර්තු 14 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ පුරවා නොතිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලත් තනතුරු සඳහා උපදේශකවරුන් දෙදෙනෙකු, ලිපිකරුවන් දෙදෙනෙකු සහ පද්ධති විශ්ලේෂකයෙකු ඇතුළත් සේවකයින් හත්දෙනෙකු ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා ඒ සඳහා රු.3,158,130 ක් ගෙවා තිබුණි.

(ආ). කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 33 සහ 2007 අප්‍රේල් 05 දිනැති චක්‍රලේඛයේ 2.2.4 වගන්තියට අනුව ව්‍යාපෘති ප්‍රධාන කාර්ය මණ්ඩලය ඇතුළුව සියලු තනතුරු සඳහා පත්වීම් ලබාදිය යුත්තේ විවෘත වෙළඳ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණ මගින් පමණි. කෙසේ වුවත්, ව්‍යාපෘතිය එවැනි කාර්ය පටිපාටි අනුගමනය කර නොතිබුණි.

(ඇ). ඉහත චක්‍රලේඛයේ 2.2.7 වගන්තියට අනුව, සතුටුදායක කාර්ය සාධනයකට යටත්ව වාර්ෂිකව බල ගැන්විය යුතු, උපරිමය වර්ෂ 03 ක කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සියලු පත්වීම් ලබාදිය යුතුයි. කෙසේ වෙතත්, ඉහත උපදෙස්වලට පටහැනිව, මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සාමාජිකයින් 34 දෙනෙකු, ව්‍යාපෘතිය මගින් තාවකාලික පදනම මත සේවයේ යොදවා තිබුණි. තවද, ප්‍රතිපත්තියක් වශයෙන් ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ව ද්විතීය පදනම මත බඳවාගෙන, ව්‍යාපෘති යටතේ ඔවුන්ට මූල්‍ය සහ අනෙකුත් ප්‍රතිලාභ අඛණ්ඩව ලබා ගැනීම සඳහා ඔවුන්ව වෙනත් ව්‍යාපෘතිවලට නිදහස් කර තිබුණි.

(ඈ). ව්‍යාපෘතිය විසින්, එම නිලධාරින් සඳහා ගෙවන ලද පාරිතෝෂික දීමනා වෙනුවට පිළිවෙලින් රු.420,903 ක්, රු.51,539 ක් සහ රු.8,590 ක් වූ පොදු කාර්ය වියදම්, එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු වැනි අමතර වියදම් ගෙවා තිබුණි.